20 ස්කන්ධය

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,

- ස්කන්ධ ප්‍රමාණ මැනීම සඳහා භාවිත වන ඒකක හඳුනා ගැනීමට,
- ස්කන්ධය මනින ඒකක අතර සම්බන්ධතාව දැන ගැනීමට සහ
- එම ඒකකවලින්, දී ඇති ස්කන්ධ එකතු කිරීමට හා අඩු කිරීමට

හැකියාව ලැබේ.

20.1 හැඳින්වීම

වෙළෙඳපොළේ ඇති විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්ත තේ කුඩු පැකට්ටු කිහිපයක් පහත දැක්වේ. එක් එක් පැකට්ටුව මත සටහන් කර ඇති ප්‍රමාණ නිරීක්ෂණය කරන්න.

මෙහි, එක් එක් පැකට්ටුවේ අඩංගු තේ කුඩු ප්‍රමාණයන්, ග්‍රෑම් (g) සහ කිලෝග්‍රෑම් (kg)වලින් දක්වා ඇති බව පෙනී යයි.

එම ප්‍රමාණ පිළිබඳ ව පහත සඳහන් පරිදි විස්තර කළ හැකි ය.

- පළමු පැකට්ටුවේ අඩංගු තේ කුඩු ප්‍රමාණය ග්‍රෑම් 50කි. එය 50 g ලෙස දක්වා ඇත.
- දෙවන පැකට්ටුවේ අඩංගු තේ කුඩු ප්‍රමාණය ග්‍රෑම් 500කි. එය 500 g ලෙස දක්වා ඇත.
- තෙවන පැකට්ටුවේ අඩංගු තේ කුඩු ප්‍රමාණය කිලෝග්‍රෑම් 1කි. එය 1 kg ලෙස දක්වා ඇත.

දැන් අපි ස්කන්ධය යනු කුමක් දැයි විමසා බලමු.

ස්කන්ධය යනු වස්තුවක ඇති ද්‍රව්‍ය ප්‍රමාණය පිළිබඳ මිනුමකි. ඒ අනුව, ඉහත 50 g ලෙස සඳහන් පැකට්ටුවේ ඇති තේ කුඩු සඳහා අදාළ ද්‍රව්‍ය ප්‍රමාණය, එනම් තේ කුඩුවල ස්කන්ධය 50 g කි. එලෙසම අනෙක් පැකට්ටු දෙකේ ඇති තේ කුඩුවල ස්කන්ධය 500 g හා 1 kg වේ.

හාල් මිටියේ ස්කන්ධය කිලෝග්‍රෑම් 50කි. එනම් 50 kg වේ.

ග්‍රෑම් සහ කිලෝග්‍රෑම් යනු ස්කන්ධය මැන ගැනීම සඳහා භාවිත වන මිනුම් ඒකක දෙකකි. අපි නිවසට අවශ්‍ය බොහෝ ද්‍රව්‍ය වෙළඳපොළෙන් මිල දී ගැනීමේ දී ග්‍රෑම් හෝ කිලෝග්‍රෑම් යන ප්‍රමාණවලින් ඒවා ලබා ගනිමු.

ස්කන්ධය මැනීම සඳහා භාවිත කරනු ලබන පඩි කිහිපයක් සහ තරාදියක් පහත දැක්වේ.

පඩියක හෝ පඩි කිහිපයක හෝ ස්කන්ධය, ද්‍රව්‍යයක ස්කන්ධය සමඟ සංසන්දනය කර, එහි ස්කන්ධය මැන ගැනීමට තරාදියක් භාවිත කරනු ලැබේ.

1 kg පඩිය යොදා ගනිමින් අල 1 kg මැන ගන්නා අයුරු පහත දැක්වේ. තරාදියේ එක් පසෙකට ස්කන්ධය මැන ගැනීම සඳහා භාවිත කෙරෙන පඩි ද අනෙක් පසට අල ද යොදනු ලැබේ.

මේ අවස්ථාවේ අලවල ස්කන්ධය 1 kgට වඩා අඩු ය.

මේ අවස්ථාවේ අලවල ස්කන්ධය 1 kgට වඩා වැඩි ය.

නොමිලේ බෙදා හැරීම සඳහා ය.



තරාදියේ බාහුව තිරස් ව පවතින මොහොතේ දී තරාදිය තුලනය වී ඇතැ යි කියනු ලැබේ. එසේ තුලනය වූ විට, අලවල ස්කන්ධය 1 kg පඩියේ ස්කන්ධයට සමාන වේ. එනම් අලවල ස්කන්ධය 1 kg වේ.

පිටි 400 g කිරා ගැනීමට 200 g පඩි දෙකක් යොදා ගත හැකි ය.

500 g සහ 100 g පඩි එකක් බැගින් තිබෙන විට පිටි 400 g පහත රූපයේ දැක්වෙන පරිදි මැන ගත හැකි ය.

500 g පඩිය   පිටි සහ 100 g පඩිය

20.2 ස්කන්ධය මැනීම සඳහා භාවිත කරන විවිධ උපකරණ

තරාදිය සහ පඩි භාවිත කිරීමේ දී, බොහෝ විට, පඩියක හෝ පඩි කිහිපයක හෝ ස්කන්ධයට සමාන ද්‍රව්‍ය ප්‍රමාණයන් මැන ගනු ලැබේ. 425 g පමණ ස්කන්ධයක් සහිත වට්ටක්කා ගෙඩියක් ඉහත 98 පිටුවේ සඳහන් පඩි යොදා ගෙන නිවරැදි ව මැනගත නොහැකි ය.එවැනි අවස්ථාවක දී, ස්කන්ධය නිවැරදි ව මැනීමට මෙම මිනුම් උපකරණවලින් එකක් භාවිත කළ හැකි ය.

මෙහි දැක්වෙන්නේ ඔබේ ශරීරයේ ස්කන්ධය වැනි ස්කන්ධයන් මැන ගැනීම සඳහා භාවිත කළ හැකි මිනුම් උපකරණ දෙකකි. එය මත සිට ගත් විට ඔබේ ස්කන්ධය එහි දර්ශකය මගින් පෙන්නුම් කෙරේ.



20.1 අභ්‍යාසය

(1) පහත දැක්වෙන එක් එක් අවස්ථාවල තරාදියේ දකුණු පස ඇති ද්‍රව්‍ය ප්‍රමාණයේ ස්කන්ධය 400 g ට වඩා වැඩි ද, 400 g ට වඩා අඩු ද, 400 g ට සමාන ද, යන්න ප්‍රකාශ කරන්න.

(i)

(ii)

(iii)

20.3 ස්කන්ධය මනින ඒකක අතර සම්බන්ධතාව

ග්‍රෑම් සහ කිලෝග්‍රෑම් යනු ස්කන්ධය මැනීමට භාවිත කරන ඒකක දෙකක් බව අපි ඉගෙන ගත්තෙමු. ස්කන්ධය මැන ගැනීමට අප විසින් භාවිත කරනු ලබන ග්‍රෑම් හා කිලෝග්‍රෑම් අතර සම්බන්ධතාව පහත දැක්වේ.

$$1000 \text{ g} = 1 \text{ kg}$$

ස්කන්ධය මනින සම්මත ඒකකය කිලෝග්‍රෑම් වේ.

ක්‍රියාකාරකම 1

පහත සඳහන් තරාදිවල වම්පස තැටියේ 1 kg පඩියක් තබා දකුණු පස තැටියට සමාන ස්කන්ධ සහිත ලී කුට්ටි යොදා ගනිමින් ඒවා තුලනය කර ඇත.
එක් එක් රූපයේ දැක්වෙන එක් ලී කුට්ටියක ස්කන්ධය ලියා දක්වන්න.

ලී කුට්ටි 2ක් ඇත.
එක් ලී කුට්ටියක ස්කන්ධය = ...

ලී කුට්ටි 4ක් ඇත.
එක් ලී කුට්ටියක ස්කන්ධය = ...

ලි කුට්ටි 10ක් ඇත.
එක් ලී කුට්ටියක ස්කන්ධය = ...

ඔබ සොයාගත් ස්කන්ධ නිවැරදි දැයි බලමු.

(i) 1 kg යනු 1000 g බැවින් ලී කුට්ටි 2හි ස්කන්ධය. 1000 g වේ. ඒ අනුව එක් ලී කුට්ටියක ස්කන්ධය 500 g වේ.

(i) 1 kg යනු 1000 g බැවින් ලී කුට්ටි 4හි ස්කන්ධය. 1000 g වේ. ඒ අනුව එක් ලී කුට්ටියක ස්කන්ධය 250 g වේ.

(i) 1 kg යනු 1000 g බැවින් ලී කුට්ටි 10හි ස්කන්ධය. 1000 g වේ. ඒ අනුව එක් ලී කුට්ටියක ස්කන්ධය 100 g වේ.

● කිලෝග්‍රෑම්වලින් දක්වා ඇති ස්කන්ධයක් ග්‍රෑම්වලින් දැක්වීම

දැන් අපි කිලෝග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධයක් ග්‍රෑම්වලින් දක්වන ආකාරය විමසා බලමු.

1 kg = 1000 g බැවින්,
2 kg = 2000 g
3 kg = 3000 g

මේ අනුව, කිලෝග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධයක් ග්‍රෑම්වලින් දැක්වීමට කිලෝග්‍රෑම් ලෙස දී ඇති ගණන 1000න් ගුණ කළ යුතු ය.

නිදසුන 1	නිදසුන 2
7 kg, ග්‍රෑම්වලින් දක්වන්න.	1 kg 250 g, ග්‍රෑම්වලින් දක්වන්න.
1 kg = 1000 g බැවින්,	1 kg = 1000 g බැවින්,
7 kg = 7 × 1000 g	1 kg 250 g = 1000 g + 250 g
= 7000 g	= 1250 g

20.2 අභ්‍යාසය

(1) හිස්තැන් සම්පූර්ණ කරන්න.

(i) 1 kg = ග්‍රෑම් 500 ඒවා ...... යි
(ii) 1 kg = ග්‍රෑම් 200 ඒවා ...... යි
(iii) 1 kg = ග්‍රෑම් 100 ඒවා ...... යි
(iv) 1 kg = ග්‍රෑම් 250 ඒවා ...... යි
(v) 1 kg = ග්‍රෑම් 125 ඒවා ...... යි

(2) පහත සඳහන් එක් එක් අවස්ථාවේ හිස්තැනට ගැළපෙන ස්කන්ධය ග්‍රෑම්වලින් ලියා දක්වන්න.

(i) 1 kg = 250 g + 100 g + 100 g + 50 g + ... g
(ii) 1 kg = 150 g + 250 g + 100 g + ... g
(iii) 1 kg = 4 × ...... g
(iv) 1 kg = 8 × ...... g
(v) 1 kg = 2 × ...... g
(vi) 1 kg = 1 × ...... g

(3) එක් එක් හිස්තැනට සුදුසු අගය ග්‍රෑම්වලින් ලියන්න.

(i) 500 g = 1 kg – ...... g
(ii) 250 g = 1 kg – ...... g

(4) පහත සඳහන් එක් එක් ස්කන්ධය ග්‍රෑම්වලින් දක්වන්න.

(i) 6 kg
(ii) 2 kg 500 g
(iii) 4 kg 150 g
(ii) 1 kg 25g
(v) 15 kg 202 g
(vi) 6 kg 666 g

නොමිලේ බෙදා හැරීම සඳහා ය.

● ග්‍රෑම්වලින් දක්වා ඇති ස්කන්ධයක් කිලෝග්‍රෑම්වලින් දැක්වීම

දැන් අපි ග්‍රෑම්වලින් දක්වා ඇති ස්කන්ධයක් කිලෝග්‍රෑම්වලින් දක්වමු.

1000 g = 1 kg බැවින්,
2000 g = 2 kg
3000 g = 3 kg

මේ අනුව, ග්‍රෑම්වලින් දක්වා ඇති ස්කන්ධයක් කිලෝග්‍රෑම්වලින් දැක්වීමට, කිලෝග්‍රෑම් ලෙස දී ඇති ගණන 1000න් බෙදිය යුතු ය.

නිදසුන 1

9000 g, කිලෝග්‍රෑම්වලින් දක්වන්න.

1000 g = 1 kg බැවින්,

$9000\text{ g} = \frac{9000\text{ kg}}{1000}$

$= 9\text{ kg}$

නිදසුන 2

2750 g, කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් දක්වන්න.

2750 g = 2000 g + 750 g
1000 g = 1 kg බැවින්,
2750 g = 2 kg + 750 g
2750 g = 2 kg 750 g

නිදසුන 3

ග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධයන් කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් දක්වමින්, පහත දැක්වෙන වගුව සම්පූර්ණ කරන්න. මේ ආකාරයට ග්‍රෑම් 1000 ක් හෝ හයට වැඩි ප්‍රමාණය කිලෝග්‍රෑම් හා ග්‍රෑම්වලින් දක්වන විට ග්‍රෑම් ගණන 1000 ට වඩා අඩු වන ලෙස ලියනු ගැබේ.

g	kg	g
999	0	999
1000	1	000
6075	6	075
7009	7	009

20.3 අභ්‍යාසය

(1) ග්‍රෑම්වලින්, දී ඇති පහත සඳහන් එක් එක් ස්කන්ධය කිලෝග්‍රෑම්වලින් දක්වන්න.

(i) 2000 g (ii) 5000 g (iii) 8000 g (iv) 12 000 g

(2) ග්‍රෑම්වලින්, දී ඇති පහත සඳහන් එක් එක් ස්කන්ධය කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් දක්වන්න.

(i) 3500 g (ii) 2065 g (iii) 4005 g (iv) 3250 g (v) 10 050 g

(3) ග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධය, කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් දක්වමින් පහත දැක්වෙන වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

g	kg	g
875	....	....
1035	....	....
....	1	005
3015	3	....
4380	....	....
....	8	150
12 565	....	565

20.4 ස්කන්ධ එකතු කිරීම තවදුරටත්

ත්‍රිපෝෂ ග්‍රෑම් 500කට සීනි ග්‍රෑම් 250ක් එකතු කළ විට සෑදෙන මිශ්‍රණයේ ස්කන්ධය කොපමණ දැයි සොයා බලමු.

දී ඇති ස්කන්ධ දෙක ම ග්‍රෑම්වලින්, දී ඇත. එක ම ඒකකයෙන් මෙම ස්කන්ධ ප්‍රමාණ දක්වා ඇති හෙයින් දක්වා ඇති පරිදි එකතු කරමු.

$$\begin{array}{r} 500\text{ g} \\ 250\text{ g} \\ \hline 750\text{ g} \\ \hline \end{array}$$

ඒ අනුව, මිශ්‍රණයේ ස්කන්ධය 750 g වේ.

කේක් එකක් සෑදීමේ දී පිටි 1 kg 500 g ද සීනි 1 kg 250 g ද මාගරින් 1 kg 500 g ද මිශ්‍ර කරනු ලැබේ. මිශ්‍රණයේ ස්කන්ධය කොපමණ දැයි සොයා බලමු.

කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් දී ඇති මෙම ස්කන්ධ එකතු කිරීමේ දී, කිලෝග්‍රෑම් එක් තීරයකටත් ග්‍රෑම් එක් තීරයකටත් ලියා ගත යුතු වේ.

kg	g
1	500
1	250
+ 1	500
4	250

ග්‍රෑම් තීරුවේ ප්‍රමාණ එකතු කරමු.

500 g + 250 g + 500 g = 1250 g

1250 g = 1000 g + 250 g

1000 g = 1 kg බැවින්, 1250 g = 1 kg + 250 g

250 g, ග්‍රෑම් තීරුවේ ලියමු. 1 kg කිලෝග්‍රෑම් තීරුවට ගෙන ගොස් එකතු කරමු.

එවිට කිලෝග්‍රෑම් තීරුවේ එකතුව 1 + 1 + 1 + 1 = 4 එනම් 4 kg වේ.

පිළිතුර 4 kg 250 g.

නිදසුන 1

kg	g
2	750
+1	450
4	200

ග්‍රෑම් තීරුවේ සංඛ්‍යා එකතු කරමු.

750 g + 450 g = 1200 g

1200 g = 1 kg + 200 g

200 g ග්‍රෑම් තීරුවේ ලියමු. 1 kg , කිලෝග්‍රෑම් තීරුවට ගෙන යමු.

එවිට කිලෝග්‍රෑම් තීරුවේ එකතුව 1 + 2 + 1 = 4

පිළිතුර 4 kg 200 g.

20.4 අභ්‍යාසය

(1) පහත සඳහන් එක් එක් ස්කන්ධ එකතු කර පිළිතුර කිලෝග්‍රෑම්වලින් හා ග්‍රෑම්වලින් දක්වන්න.

(i)

kg	g
2	750
+ 1	250

(ii)

kg	g
3	65
+ 2	150

(iii)

kg	g
5	623
+ 3	750

(iv)

kg	g
3	150
2	750
+ 1	400

(v)

kg	g
1	75
2	250
+ 1	800

(vi)

kg	g
1	50
2	250
+ 1	850

(2) වෙළෙඳසලකින් හාල් 2 kg ද, සීනි 1 kg ද, තේ කොළ ග්‍රෑම් 250 ද, පිටි ග්‍රෑම් 500 ද රතු ලූනු ග්‍රෑම් 250ක් ද මිල දී ගත් විට, මෙම බඩුවල මුළු ස්කන්ධය සොයන්න.

(3) හිස් ගෑස් සිලින්ඩරයක ස්කන්ධය 3 kg 750 g වේ. එහි 12 kg 500 g ගෑස් පුරවා ඇත. ගෑස් සහිත සිලින්ඩරයේ ස්කන්ධය කොපමණ ද?

(4) ගංවතුර සහනාධාර සඳහා එක් නිවසකට ලබා දෙන වියළි ආහාර ද්‍රව්‍ය පාර්සලයක අඩංගු ද්‍රව්‍ය සහ ප්‍රමාණ පහත දැක්වේ.

හාල් 5 kg	කරවල 500 g	පිටි 500 g
සීනි 1 kg	පරිප්පු 2 kg 500 g	තේ කොළ 250 g

මෙම ද්‍රව්‍යවල මුළු ස්කන්ධය සොයන්න.

(5) වට්ටක්කා ගෙඩියකින් ස්කන්ධය 1 kg 350 g වූ කෑල්ලක් කපා විකුණූ පසු ඉතිරි කැබැල්ලේ ස්කන්ධය 2 kg 850 g විය. වට්ටක්කා ගෙඩියේ මුළු ස්කන්ධය සොයන්න.

(6) එක් වැලක තිබූ වට්ටක්කා ගෙඩි දෙකක ස්කන්ධ පිළිවෙළින් 2.35 kg හා 3.8 kg වේ. වට්ටක්කා ගෙඩි දෙකෙහි මුළු ස්කන්ධය කොපමණ ද?

20.5 ස්කන්ධයන් අඩු කිරීම තව දුරටත්

ගෘහණියක් තම ගෙවත්තෙන් ලබා ගත් ගම්මිරිස් 2 kg 750 g අව්වේ දමා දින කිහිපයක් වියළා ගැනීමෙන් පසු, නැවත කිරා ගත් විට එහි ස්කන්ධය 1 kg 200 g විය. වියළීමේ දී ස්කන්ධය කොපමණ ප්‍රමාණයකින් අඩු වී දැයි සොයමු.



අඩු වූ ස්කන්ධය සොයා ගැනීමට අමු ගම්මිරිස්වල ස්කන්ධයෙන් වියළීමෙන් පසු ස්කන්ධය අඩු කර ගත යුතු වේ. එහි දී, එක් තීරයක ග්‍රෑම් ද අනෙක් තීරයේ කිලෝග්‍රෑම් ද පිහිටන පරිදි, ලියා ගනිමු.

	kg	g
	2	750
−	1	200
	1	550

එකිනෙක අඩු කළ විට 1 kg 550 g ලැබේ. මේ අනුව ගම්මිරිස් වියළීමේ දී ස්කන්ධය 1 kg 550 gකින් අඩු වී ඇත.

නිදසුන 1

බිස්කට් සමඟ පෙට්ටියක ස්කන්ධය 2 kg 250 g වේ. හිස් පෙට්ටියේ ස්කන්ධය 750 g නම් පෙට්ටියේ තිබූ බිස්කට්වල ස්කන්ධය සොයන්න.

	kg	g
	2	250
−	0	750
	1	500

250, 750ට වඩා කුඩා වේ. කිලෝග්‍රෑම් තීරයේ ඇති 2 kg න් 1 kg කිලෝග්‍රෑම් තීරයට ගෙන යමු.

එවිට කිලෝග්‍රෑම් තීරයේ 1 kg ඉතිරි වේ.

එවිට, 1000 g + 250 g = 1250 g

දැන් 1250 g − 750 g = 500 g

පෙට්ටියේ තිබූ බිස්කට්වල ස්කන්ධය 1 kg 500 g වේ.

20.5 අභ්‍යාසය

(1) අඩු කරන්න.

(i)

	kg	g
	3	200
−	1	100

(ii)

	kg	g
	2	750
−		500

(iii)

	kg	g
	4	000
−	2	500

(iv)

	kg	g
	3	250
−	1	500

(v)

	kg	g
	4	050
−	2	200

(vi)

	kg	g
	6	025
−	2	250

(2) අමු තේ දළු 1 kg වියළීමේ දී එහි ඇති ජලය ඉවත් වේ. අවසානයේ ඉතිරි වූ වියළි තේ දළුවල ස්කන්ධය 180 g වේ. එහි තිබී ඉවත් වූ ජලයේ ස්කන්ධය කොපමණ ද?

(3) කිලෝග්‍රෑම් 3ක කොස් ගෙඩියක් කපා ලබා ගත් මදුළුවල ස්කන්ධය, 1 kg 650 g වේ. කපා ඉවත් කළ කොටස්වල ස්කන්ධය කොපමණ ද?

(4) සඳුදා උදෑසන වන විට නිමල්ගේ නිවසේ තිබූ සීනි ප්‍රමාණය 1 kg 500 g වේ. අඟහරුවාදා උදෑසන සීනි ප්‍රමාණය මැන බැලූ විට, එහි තිබුණේ සීනි 800 g වේ. එම කාලය තුළ භාවිතයට ගත් සීනි ප්‍රමාණයේ ස්කන්ධය කොපමණ ද?

(5) වෙළෙඳසලක තිබූ 12 kg 750 gක පරිප්පු තොගයකින් දවස අවසානයේ ඉතිරි වී තිබුණේ, 8 kg 250 gකි. දවස තුළ විකුණන ලද පරිප්පු ප්‍රමාණයේ ස්කන්ධය සොයන්න.

(6) ගෑස් සිලින්ඩරයක ගෑස් සමග ස්කන්ධය 13 kg 250 g වේ. ගෑස් හිස් වූ පසු හිස් ටැංකියේ ස්කන්ධය 2 kg 450 gකි. එහි තිබූ ගෑස්වල ස්කන්ධය සොයන්න.

(7) මල්ලක සහල් 5.85 kg තිබිණි. ඉන් 2.17 kg පිසීමට යොදා ගත්තේ නම්, ඉතිරි වූ සහල් ප්‍රමාණය කිලෝග්‍රෑම් කොපමණ ද?

මිශ්‍ර අභ්‍යාසය

(1) හිස් තැන් සම්පූර්ණ කරන්න.

(i)

	kg	g
	2	250
+	☐	☐
	4	75

(ii)

	kg	g
	3	500
−	☐	☐
	1	750

(2) තැපැල් කාර්යාලයකට දිනක දී, ලැබුණු පාර්සල් 3ක ස්කන්ධ පිළිවෙළින් 2 kg 500 g , 3 kg, 1 kg 750 g වේ. පාර්සල් 3හි මුළු ස්කන්ධය කිලෝග්‍රෑම් සහ ග්‍රෑම්වලින් ප්‍රකාශ කරන්න.

(3) ශිෂ්‍යයකුගේ පොත් බෑගයේ අඩංගු ද්‍රව්‍යවල ස්කන්ධයන් පහත දැක්වේ.

පෙළ පොත්වල ස්කන්ධය = 4 kg 750 g
අභ්‍යාස පොත්වල ස්කන්ධය = 2 kg 400 g
කෑම පාර්සලයේ ස්කන්ධය = 550 g
වතුර බෝතලයේ ස්කන්ධය = 375 g

ඔහුගේ පොත් බෑගයේ මුළු ස්කන්ධය 10 kg නොඉක්ම වන බව ඔහු ප්‍රකාශ කරයි. එම ප්‍රකාශය සත්‍ය ද අසත්‍ය ද යන්න හේතු දක්වමින් පෙන්වා දෙන්න.

(4) සහල් බෑගයක ස්කන්ධය 5.35 kg කි. හිස් බෑගයේ ස්කන්ධය 0.75 kg නම්, එහි අඩංගු සහල්වල ස්කන්ධය කොපමණ ද?

(5) ගුවන් මගියකුට තම ගමන් මල්ලේ නොමිලේ ගෙන යෑමට අවසර දී ඇති ද්‍රව්‍ය ප්‍රමාණයේ ස්කන්ධය 30 kgකි. මගියා ළඟ මේ වන විට මිල දී ගෙන ඇති භාණ්ඩවල ස්කන්ධය 14 kg 750 kgකි. ඔහුට 30 kg සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් මිල දී ගත හැකි ද්‍රව්‍ය ප්‍රමාණයේ ස්කන්ධය සොයන්න.

සාරාංශය

- ස්කන්ධය මැනීමට බහුලව භාවිත වන ඒකක වන්නේ, ග්‍රෑම් (g) හා කිලෝග්‍රෑම් (kg) වේ.
  1000 g = 1 kg
- කිලෝග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධ ප්‍රමාණයක් ග්‍රෑම්වලින් ප්‍රකාශ කිරීමට කිලෝග්‍රෑම් ලෙස දී ඇති ගණන 1000න් ගුණ කරනු ලැබේ.
- ග්‍රෑම්වලින් දී ඇති ස්කන්ධ ප්‍රමාණයක් කිලෝග්‍රෑම්වලින් ප්‍රකාශ කිරීමට ග්‍රෑම් ලෙස දී ඇති ගණන 1000න් බෙදනු ලැබේ.